**අප පිලිබඳ.....**

සිංහලයා පුවත් ඒජන්සියේ නිර්මාණය, ගමන් මග මෙන්ම එහි ජාතික කර්තව්‍යය විස්තර කරනු කැමැත්තෙමු.

www.Sinhalaya.Com වෙබ් ලිපිනය යටතේ දියත් වන සිංහලයා පුවත් ඒජන්සිය සිංහලයා මාධ්‍ය ජාලයට අනුබද්ධිතව වසර 2002 දී නිර්මාණය වනු ලබන්නේ එහි **කතෘ සහ වත්මන් විධායක අධ්‍යක්ෂ චන්න ඊ. කටුවාවලගේ මහතා** අතිනි.

www.Sinhalaya.Com යනු ප්‍රධාන වශයෙන් පුවත් ඒජන්සියක් වුවද වෙබ් අඩවිය පරිශීලනය කරන්නන්ට ලාංකේය ඉතිහාසය, සාහිත්‍යය, කලාව, ජන මූලාශ්‍ර පිලිබඳ සාරගර්භ තොරතුරු ලබාගත හැකි වෙබ් පුස්තකාලයක් සැපයීමට අමතරව, සාමාජික සබඳකම් පවත්වාගෙන යෑමට සිංහල චැට් අඩවියක් මෙන්ම අධ්‍යාපනික වටිනාකමින් යුත් විවෘත සංවාද සඳහා ෆෝරමයන් ද පවත්වාගෙන යයි.

සිංහලයා පුවත් ඒජන්සිය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුයේ ජාතික වටිනාකමකින් යුතු පුවත් නිවැරදිව ලොවපුරා විසිරී සිටින ශ්‍රී ලාංකිකයින් වෙත සමීප කරවීමයි. ජනතාවට වගකියන, නිරවද්‍ය තොරතුරු ඉක්මනින් ලබාදෙන වෙබ් මාධ්‍යයක අඩුව සිංහලයා පුවත් ඒජන්සිය විසින් මනාව පිරවූ බව පවසන්නේ නිහතමානී ආඩම්බරයකිනි.

සිංහලයා පුවත් ඒජන්සිය ප්‍රධාන වශයෙන් ආරක්ෂක, සාහිත්‍යය, සංස්කෘතික තොරතුරු මෙන්ම අවස්ථානුකූලව දේශපාලනික තොරතුරු ද ආවරණය කරනු ලබයි.

සිංහලයා පුවත් ඒජන්සිය ආමන්ත්‍රණය කරනු ලබන්නේ ලොව පුරා විසිර සිටින ශ්‍රී ලාංකිකයින් ප්‍රමුඛ කරගත්, එසේම කිසියම් පෙර නිර්ණය කරනු ලැබූ වයසතල හෝ සමාජ තල වලට සීමා නොවූ වඩා පුළුල් ග්‍රාහක පිරිසකටය...

සිංහලයා පුවත් ඒජන්සියේ මාධ්‍ය කාර්යයන් ලෙස පුවත් පල කිරීම, පුවත් සංස්කරණය, පුවත් විමසුම, ජාතික සහ අන්තර්ජාතික මාධ්‍යයන් වලට පුවත් අලෙවිය දැක්විය හැකි වුවද, ඒ සියල්ලට වඩා ප්‍රමුඛ කර්තව්‍යයක් ඇත්තේය. ඒ, මව්බිමේ ස්වෛරීභාවයට, නිදහසට හෝ කීර්තිනාමයට හානි කිරීමට යත්න දරන දේශීය, විදේශීය කුප්‍රකට බලවේග වලට පහර දෙමින් පාඨක විඥාණයට ආමන්ත්‍රණය කිරීමයි.

**සිංහලයා මාධ්‍ය දර්ශනය :**

සුජාතික බලවේග සමග අත්වැල් බැඳගනිමින් මව්බිමේ ස්වෛරීත්වය උදෙසා වූ සිංහලයා පුවත් ඒජන්සියේ මාධ්‍ය ප්‍රතිපත්තිය වනාහී ඇරඹුමේ සිටම අපේ සියළු ජයග්‍රහණ සහ පරාජයන්හී අප සමග සිටි අපේ සහෘදයින්ගේ අදහස් වලින් පෝෂණය වූවකි.

**අප මාධ්‍ය ගමන්මග :**

වගකිවයුතු මාධ්‍ය ආයතනයක් ලෙස, ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකගනිමින් ජාතියට සේවය කිරීමට සිංහලයා පුවත් ඒජන්සිය තම කටයුතු මෙහෙයවයි.

සරලව කියතොත්, සිංහලයා පුවත් ඒජන්සිය යනු ලංකාවේ සත්‍ය තත්වය ලාංකීය ඇසකින් බලා එය ජාත්‍යන්තරය වෙත ගෙන යන වගකිවයුතු මාධ්‍ය ආයතනයකි.

**අප මාධ්‍ය ප්‍රතිපත්තිය :**

මව්බිමට, සිංහල ඇතුළු සෙසු ජාතීන්ට, බුදු සසුනට හෝ වෙනයම් දහමකට වාසි හෝ හානි ගෙන දෙන යම්කිසි සිදුවීමක් වනතුරු පසෙකින් බලා සිට පසුව ඒ ආකාරයෙන් ම වාර්තාකරමින් ඇඟ බේරා ගන්නා "මධ්‍යස්ථ මාධ්‍යකරණය" යන ඊනියා සංකල්පය හිසමත තබාගෙන කටයුතු කිරීමේ පිලිවෙතකට වඩා,

" ඕනෑම සිදුවීමක් පිලිබඳ සත්‍යය හඹා යෑමත් සමගම, එම සිදුවීම දේශීය ඇසකින් දේශීය සහ විදේශීය ග්‍රාහක ජාලය වෙත සැණෙකින් සංසරණය කරමින් සෑමවිටම ජනතාවට ඉදිරියෙන් පරමාදර්ශී ව ගමන්ගන්නා මාර්ගෝපදේශකයෙක් සේ කටයුතු කිරීම " සිංහලයා මාධ්‍ය ප්‍රතිපත්තිය බව අභිමානයෙන් පවසා සිටිමු.

**යාවත්කාලීන ප්‍රතිපත්තිය :**

කොහේ හෝ සිදුවන ඕනෑම සිදුවීමක් වාර්තා කිරීමෙන් බැහැරව, ප්‍රවෘත්තිමය වටිනාකමක් සහ ජාතික වැදගත්කමකින් යුතු පුවත් පමණක් අප ග්‍රාහකයින් වෙත සමීප කිරීම සිංහලයා පුවත් ඒජන්සියේ අපගේ වගකීමයි. දවසේ සෑම විනාඩියක් පුරාම යාවත්කාලීන වීමක් සිංහලයා පුවත් ඒජන්සිය තුල ඔබ නොදැකීමේ අරුමය එයයි. අපගේ පුවත් යාවත්කාලීන වන කාල පරාසය නිශ්චිත නොවන අතර, එය දිනයේ සෑම විනාඩියක් පාසා ද ඇතැම් විට දින හෝ සති ගණනක් දක්වාද විහිදිය හැකිය. එය තීරණය වන්නේ ජාතික මට්ටමේ අදාල සිදුවීම් තුල ඇති "මනා පුවත් වටිනාකම්" මත ය.

ජාතික මට්ටමින් වැදගත් වන කිසියම් සිදුවීමක හෝ සිදුවීම් දාමයකට සම්බන්ධ ව ජනතාවගේ බුද්ධියට ආමණ්ත්‍රණය කරනු වස්, පුවත් විත්ති, පණිවිඩ, ඡායාරූප, වීඩියෝ දර්ශණ, විශේෂාංග, විමසුම් සහ ලිපි පල කිරීම යනු අපගේ යාවත්කාලීන ප්‍රතිපත්තිය යි.

**අපගේ මෙහෙයුම්....**

සරලය....

සිංහලයා මාධ්‍ය ජාලය පිටුපස සිටින ජව බල තුනකි...

**පලමුව**, මේතාක් ඔබ කියවූ සහ ඉදිරියට කියවන්නට නියමිත අප **මාධ්‍ය කරතව්‍යයයි**...

**දෙවනුව**, සිංහල චැට්, විවිධාකාර සාමාජීය බැඳීම්, සාහිත්‍යය හා ඉතිහාසය පිලිබඳව ගවේෂණයට සහ විවෘත සංවාද සඳහා **අප වෙබ් අඩවිය හරහා** අප ග්‍රාහකයින්ට **නොමිලයේ** ඉඩ හසර සපයන **රසවින්දනාත්මක අංගයි**.

අප කාර්ය ශක්තීන්, තාක්ෂණික ඥාණය, නිර්මාණ හැකියාවන් මෙන්ම යුරෝපය, මැද පෙරදිග සහ අනෙකුත් ආසියානු රටවල විහිද පැතිර ගිය අප ජාලයේ මෙහෙයුම් වල අග්‍ර ඵලය එකදු සතයක් හෝ වැය නොකර රිසිසේ අත් විඳීමට අප දයාබර ග්‍රාහකයින්ට අවස්ථාව ඇත්තේය...

**එසේ නම්, සිංහලයා පුවත් ඒජන්සියේ පැවැත්මට මූල්‍ය සම්පාදනය වන්නේ කොහෙන්ද ? කෙසේද ?**

ඔබට නැගුනු නිසැක පැනය එයයි...

අපගේ මූල්‍ය සම්පත් සම්පාදනය කරගන්නේ අප විසින්මයි..ඒ අපගේ සාම්ප්‍රදායික, පැරණි එහෙත් විශ්වසනීය සේවාවන් මගින්.

දේශීය සහ විදේශීය ජනමාධ්‍යයන්ට පුවත් අලෙවියට අමතරව, සිංහලයා වර්ල්ඩ්වයිඩ් මගින් පවත්වාගෙන යනු ලබන SINHALAYA Web Services (http://www.Veholdings.Com) සිංහලයා වෙබ් සේවාවන් මගින් සේවාදායකයින් වෙත ලබාදෙන්නාවූ සාධාරණ සේවා කටයුතු අප මාධ්‍ය ජාලයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලයි.

විටෙක ජනමාධ්‍යවේදීන් වන අප විධායක අධ්‍යක්ෂවරයාගේ සිට පහල මට්ටමේ සේවකයා දක්වා වන අප කාර්යමණ්ඩලය තවත් විටෙක මුළු දවස පුරාම ක්‍රියාත්මක වෘත්තීමය ග්‍රාහක සත්කාරක සේවාවක කොටස්කරුවෝ වෙමු.

එමතුද නොව, අප සේවාදායකයින් හඳුනාගෙන ඔවුන්ගේ විවිධාකාර වූ අවශ්‍යතාවයන්ට අනුරූපීව අප දැනුම, ක්‍රියාශීලීත්වය සහ නිර්මාණ ශක්තිය නොමසුරුව ලබාදීමට නොපසුබට වෙමු.

මේ අප ඔබට විස්තර කලේ අප **වෘත්තීමය ශක්තියයි**. ඔබට නැගුණු පැනයට පිලිතුරයි.

එනම්, මේ ත්‍රිත්ව ශක්තීන් සමග සිංහලයා පුවත් ඒජන්සිය කිසිවෙකුට කිසිවකට ගැති නොවූ මාධ්‍ය ආයතනයකි.

**අපේ ගමන :**

සාමාජීය ජාලයක් ලෙස සිංහලයා වර්ල්ඩ්වයිඩ් (SINHALAYA WORLDWIDE®) මූලිකව ස්ථාපිත වුවත්, ශ්‍රී ලංකා ආරක්ෂක සේනාවන් විසින් 2006 වසරේ ජූලි මාසයේදී නැගෙනහිර මුදවා ගැනීමේ ක්‍රියාන්විතය ඇරඹුමත් සමග සිංහලයා පුවත් ඒජන්සිය ආරක්ෂක තොරතුරු වාර්තාකරණ කටයුතු වෙත නැඹුරු විය. වර්තමානයේ සිංහලයා පුවත් ඒජන්සිය ආරක්ෂක තොරතුරු සහ ජාතික පුවත් අංශ හරහා ප්‍රධාන වශයෙන් තම සේවය ජනතාවට ලබාදෙයි.

නැගෙනහිර සහ වන්නි ක්‍රියාන්විත දියත්වන වකවානු වලදී ගැටුම් පවතින ප්‍රදේශ වලට වැඩිමවාර ගණනක් ගොස් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ආරක්ෂක තොරතුරු වාර්තාකරණයේ යෙදුනු එකම වෙබ් අඩවිය සිංහලයා පුවත් ඒජන්සියයි.

ආරක්ෂක හමුදාවන් ත්‍රස්තවාදීන් සමග සටන් වදිද්දී, දේශීයව සහ අන්තර්ජාතිකව ක්‍රියාත්මක වූ ත්‍රස්ත හිතවාදී ඩයස්පොරාවේ ඊනියා මතවාද බිඳලමින්, ඔවුන්ගේ ක්‍රියාකාරකම් අඩපණ කිරීමට සිංහලයා පුවත් ඒජන්සිය වෙතින් නිහඬව සිදුවූ කාර්භාරය සුළු පටු නොවන අතරම, ඒ පිලිබඳව අප ලබන ආත්ම තෘප්තියම වටී.

අවස්ථානුකූලව, අප වෘත්තීමය / නොවන, නිල සහ නිල නොවන මට්ටමින් එමෙන්ම රහස්‍ය ලියුම්කරුවන් යොදාගනිමින් අප දියත්කල මාධ්‍ය මෙහෙයුම් මගින් රැස්කරගත් තොරතුරු තත්කාලීනව ආරක්ෂක අංශ වෙත ලබා දීමට ද අප කටයුතු කලෙමු.

සිංහලයා පුවත් ඒජන්සිය යනු සයිබර් මාධ්‍යය හරහා සමාජයේ සෑම සියළු පුරවැසියකුගේ ම විඥාණයට අමතන ශ්‍රී ලංකාවේ පුරෝගාමී මාධ්‍ය ජාලයකි.

මෑතකදී, සිංහලයා පුවත් ඒජන්සිය තම මාධ්‍ය මෙහෙවරෙහි තවත් වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරමින්, සිංහලයා පුවත් හි යුනිකෝඩ් සංස්කරණය එලි දක්වන ලදී.

ඒ අනුව, සිංහලයා මාධ්‍යජාලය තම **නිල පුවත් සංස්කරණ 3කින් සහ එක් අනු සංස්කරණයකින්** පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

සාමාන්‍ය සිංහල පුවත් සංස්කරණ ( යුනිකෝඩ් නොවන ), ප්‍රධාන සිංහල යුනිකෝඩ් සංස්කරණය, ප්‍රධාන ඉංග්‍රීසි පුවත් සංස්කරණය ද සමග අනු සංස්කරණයක් ලෙස "ෆේස් බුක්" සාමූහික ග්‍රාහක ජාලය තුලද සිංහලයා පුවත් නිරතුරු යාවත්කාලීන වනු ඇත.

යුනිකෝඩ් හෝ වෙනත් කිසිදු සාමන්‍ය අකුරු වර්ගයක් ලබා ගැනීමේ පහසුකම නොමැති අප ග්‍රාහකයින් සඳහා "ෆේස් බුක්" සාමූහික ග්‍රාහක ජාලයේ සිංහලයා පුවත් අනු සංස්කරණය තුල අප නිල පුවත් හී රූපමය සංස්කරණයක් ද සපයා ඇත.

එයද සිංහලයා ප්‍රධාන පුවත් සංස්කරණයන් සමග සමගාමීව යාවත්කාලීන වේ.

ඒ අනුව, සෑම මට්ටමකම පාඨක පිරිස් ආවරණය කරනු වස් නොයෙකුත් ස්වරූප ඔස්සේ තම නිල පුවත් සංස්කරණ වැඩිම ගණනකින් පවත්වාගෙන යන එකම මාධ්‍ය ජාලය ලෙස සිංහලයා මාධ්‍ය ජාලය ශ්‍රී ලාංකේය මාධ්‍ය ක්ෂේත්‍රයේ තම නම සටහන් කර ඇත.

මෙයට අමතරව, සිංහලයා පුවත් හී දමිළ සංස්කරණයක් ද ලඟදීම එලි දැක්වනු ඇති.

සිංහලයා පුවත් හී සිංහල සංස්කරණ ලාංකීය ජනතාවගේ හදවතට ආමන්ත්‍රණය කරන අතරම, සිංහලයා පුවත් ඉංග්‍රීසි සංස්කරණය ජාත්‍යන්තර ප්‍රජාවට ශ්‍රී ලංකාවේ සැබෑ තතු ලාංකීය ස්වරයකින් ලබාදේ.

මේ සියළු කටයුතු අතරේ, සිංහලයා පුවත් ඒජන්සියේ නිෂ්පාදක කණ්ඩායම විසින් දේශීයව පැවැත්වෙන ජාතික වටිනාකමකින් යුතු සියළු උත්සව අවස්ථාවන් හී සවිස්තරාත්මක, ඇසිදිසි රූපමය වාර්තාවන් නිපදවන්නේ එම උත්සව සියැසින් දැකගැනීමේ අවස්ථාව අහිමි විදෙස්ගත් ශ්‍රී ලාංකිකයින් වෙත ලබාදෙන තිලිණයක් වශයෙනි.

ජාතික නිදහස් දින සැමරුම්, ජාතියේ විජයග්‍රහණ සැමරුම්, "දැයට කිරුළ" ප්‍රදර්ශණය මෙන්ම ශ්‍රී ලංකා යුද හමුදාවේ 60 වන සංවත්සර සැමරුම් අළලා නිපදවූ ඇසි දිසි වාර්තාමය වැඩසටහන් එයින් කිහිපයකි.

එමෙන්ම, සිංහලයා පුවත් ඒජන්සියේ මාධ්‍ය කණ්ඩායම විසින් නැගෙනහිර සහ වන්නි ක්‍රියාන්විත අතරතුර ගැටුම් පවතින ප්‍රදේශ වල කල සියළු සංචාර අළලා නිපදවූ වාර්තාමය වැඩසටහන් ද නිකුත් කර ඇත්තේ සමස්ත ලාංකේය පුරවැසියන්ගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරමින්.

පසුගිය වසර 8 දෙස ආපසු හැරී බලනවිට, ප්‍රමාණයෙන් කුඩා මාධ්‍ය ආයතනයක් වුවද, ජාතිය සහ ජාතික ආරක්ෂාව උදෙසා අප මාධ්‍ය කණ්ඩායම විසින් සිදුකල නිහඬ එහෙත් සුවිශාල කරතව්‍යය පිලිබඳව අප තුල ඇත්තේ ඉමහත් ආත්ම තෘප්තියක් සහ නිහතමානී ආඩම්බරයකි.

ලාභ ලබන ආයතනයක් වුවත්, රාජ්‍ය, පෞද්ගලික, දේශීය හෝ විදේශීය කිසිදු ආයතනික අනුග්‍රහයකින් තොරව, සරල එහෙත් **මනාව සංවිධානය වූ නිදහස් මාධ්‍ය ජාලයක් ලෙස ඉපදුනු රටට ණය නැති සිංහලයා මාධ්‍ය ජාලයේ එක පැතුම "කිසිදා රටේ අංක එක වීම නොව, රට ලොවේ අංක එක" බවට පත් කිරීමයි.**